

සුප්පා දේවිය ගේ දෛවය විසඳන්නේ කැලයේ රජා වූ සිංහයා හමුවීමෙනි. කුමරිය ගැලක සැඟවී ඈතට පිටමං වුයේ තැති ගැන්මෙනි. සිංහයා ගැල්කරුවන්ට පහරදීමේ අටියෙන් ගැල්පෙළ වෙත ළඟා වන විට අපට සිදු වූයේ ශාස්ත්‍රකරු පළ කළ අනාවැකියයි. ඒ සමඟම ඇගේ බිය පහව ගොස් සිංහයා සමඟ තම ජීවිතාන්තය තෙක් ගත කිරීමේ අටියෙන් සිංහයා ස්පර්ශ කරයි.

සිංහයා සිතන්නේ රූමත් මේ කුමරිය මා අසළට පැමිණෙන්නේ බියක් නැතිව ද යන්නයි. නුඹ මා වෙතින් පළා නො යන්නේ ඇයි? නුඹ මට බිය නැතිදැයි විමසූ විට කුමරිය ගෙන් සිංහයාට ලැබෙන්නේ අපේක්ෂා කළාට වඩා හාත්පසින් වෙනස් පිළිතුරකි. කුමරිය පවසන්නේ 'මට ඔබට බියවීමට කිසිදු බියක් නැහැ. මා ඔබට බියෙන් දුවනවා නම් එය නිවට ක්‍රියාවකි. මන්ද ඔබ කැලේ රජතුමා ය. කැලේ භයානකම සතා ඔබයි. එහෙත් ඔබෙන් මට හිරිහැරයක් නොමැති නම් වෙනත් කිසිදු උවදුරක් මේ මහා වනයේ මට නැහැ.' යන්නයි.

# සූප්පා දේවියට රජ සැප සිංහයාට මරණය අපට?

එක් ව විසීමෙන් ඔවුහු පුතකු හා දුවක ලබති. පුතු සිංහබාහු වන අතර දියණිය සිංහ සීවලී ය. සිංහයා තම බිරිඳට හා දරුවන්ට ගල්ලෙනක් තනන්නේ මිනිස් කටහඬවල් ඇසී ඔවුන් පිටමං වෙතියි බියෙනි. එහෙත් සිංහබාහු තරුණ වියට එළඹෙත්ම සිංහයා ගේ මේ ක්‍රියාව නො ඉවසයි. සිංහයා ගේ මේ ක්‍රියාව දාරක ප්‍රේමය නිසා උපන් එකක් යැයි සිංහබාහු නො දනී. සිංහයා ගොරවා 'මා මේ ක්‍රියාව කළේ භයානක නපුරු උවදුරුවලින් ඔබලා ආරක්ෂා කර ගැනීම පිණිස යැයි කීව ද පුතාට මව ගේ හා පියා ගේ ශරීර හැඩරුවෙහි ඇති වෙනස කතාබහේ වෙනස ආදිය හොඳින් අවබෝධ වෙයි. ඉන් නො නැවතුණු ඔහු මව ගෙන් සත්‍ය විස්තර දැන ගනී. පසුව ලෙන් දොර විවර කර ගෙන ගංගා, ගණ කැලෑ තරණය කරමින් රජවාසල බලා ගමන් ගනී. සිංහයා සිංහනාද කරමින් රට වැසියන් ගේ ගම් දෙවනත් කරමින් ගම්බිම් පීරමින් තම අඹු දරුවන් සොයමින් සැරිසරයි.

ගොවිතැන්වලින් ද මිදී නව රැකියාවන් සඳහා යොමු වී ඇති බව අපට අද දැකගත හැකි ය. නූතන වැදි දරුවෝ වේගයෙන් මහා සමාජයට අනුගත වෙමින් සිටිති. මෙය ද වත්මන් වැදි සමාජයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

ඉහත සඳහන් කළ දෑ ආදිවාසීන් ගේ ජීවිත පිළිබඳ අල්පමාත්‍රයකි. තව බොහෝ දෑ ඔවුන් ගේ සමාජය මඟින් පිළිබිඹු කරනු ඇත. කෙසේ වුව ද ආදිවාසීන් වූ කලි අපේ රටේ ඓතිහාසික උරුමයකි. එසේ ඔවුන් ගේ සංස්කෘතිය රැකගෙන ඉදිරි පරපුරට දායාද කිරීම මෙන් ම අප ගේ ජාතික ශිෂ්ටාචාරය රැකගැනීම ද අප ගේ පරම යුතුකම වන්නේ ය. ■

**රසිකා පුෂ්පකුමාරි**

ගල් ලෙන බිඳලා
ලෙන් දොර හැරලා
සිංහ බා....සිංහ බා....සිංහ බා....
මා සොඳුර මා සොඳුර මා සොඳුර
මා ප්‍රිය දියණිය සිංහ සීවලී
ඈත් ගොසින් ය ඈත් ගොසින් ය
ඇයි සුදු දුවණියෙ නුඹ වත් නොසිටියෙ
මොළකැටි වදනින් මා සනසන්නි ය
අහර පිසින්නි ය.....
සොහොයුරා නම් ඔලමොළ ගති ඇත
නුඹ මෙන් මුදු නැත.....

මේ බව දැනගත් රජතුමා රජ මාළිගයේ සිට ඇතෙකු පිට රත්තරන් ගෝනි පුරවා සිංහයා මර්දනය කළ හැකි අයෙක් සොයයි. සිංහබාහු සිංහයා මර්දනයට පිටත් වෙයි. සුප්පා දේවිය එය වළකන්නට උත්සාහ ගත්ත ද නො හැකි වෙයි. සිංහයා සිංහබාහු දැක සතුටුව පුතා සිපගන්නට ඉදිරියට පැමිණෙයි. දාරක ප්‍රේමයෙන් පිරුණු සිංහයාට සිංහබාහු විදින එකදු ඊතලයක් වත් නොවදී. එහෙත් සිංහයා ඔහුට දඬුවම් දෙන්නට යද්දී ඊතලයක් සිංහයා ගේ හදවත පසාරු කර ගනී.

සිංහබාහු සිංහයා විනාශ කිරීමෙන් රටවැසියන් ගේ ප්‍රසාදයට පමණක් නො ව රාජ්‍ය ගෞරව ඇතිව රජවාසලේ රජ වන්නේ තම මෑණියන් ගේ පාර්ශ්වයේ රාජ්‍ය උරුමය ද ලබා ගනිමිනි. ඉන් සුප්පා දේවිය නැවත විවාහ වෙයි. සුප්පා දේවිය තම දෛවය නැවත වරක් විවාහ වීමෙන් විසඳා ගනිද්දී සිංහයා ගේ ඉරණම වූයේ මරණයයි. ඔහුගේ මහත් වු දරු සෙනෙහස බිරිය කෙරේ ඇති ආදරය නිසාම ඔහු මරණයට පත් වේ.

පුතු සෙනේ සම මස් ඇටමිදුළු තුළට වැද
දුක් දෙයි නිබන්දා....

යන්න සනාථ කරමින් සිංහයා අසීමිත සෙනෙහස සිංහබාහුට නො වැටහේ. අවසානයේ සුප්පා දේවිය රජ සැප විඳින්නට වරම් ලැබූවත් සිංහයාට සිදු වූයේ මාරයා වැළඳ ගැනීමයි. එය සිංහයා කළ අසීමිත කැප කිරීමකි. ඔහු මිය යන මොහොතේ තම දරුවන්ට හා බිරිඳට ලැබෙන්නට යන රජ සැප ගැන සිතා සිත සාදා ගත්තා වන්නට පුළුවන. ඔහු ගේ අඹුදරුවන් කෙරේ ඇති වූ අතිමහත් සෙනෙහස කෙසේ නම් මැන බලන්න ද? එය කොතරම් අනුවේදනීය ද?

සුප්පා දේවිය ආරක්ෂාව පතා සිංහයා වෙත පැමිණ සිය සැමියා ලෙස සිංහයා තෝරා ගත්තේ ශාස්ත්‍රකරුවන් ගේ ශාස්ත්‍ර සත්‍යයක් බවට පත් කරමිනි. සිංහයා හමු වී ඔබ මිස නෑ මට අන් සරණා යනුවෙන් අසරණ වූ මනමේ කුමරිය පැවසුවක් මෙන් ඈ පැවසුව ද සිංහයා ගේ අසීමිත ආදරයෙන් සෙනෙහසින් මිදීමට ද මුල්වන්නේ සුප්පා දේවියයි. සිංහයා ගෙන් පැවත එන අපි ඔහු ගේ උරුමකරුවන් වෙමු. එසේනම් ඔහු වෙනුවෙන් කම්පා වන්නට කාලයක් මිඩංගු කිරීම වරදක් නො වේ. ඔහුගේ අසීමිත කැපකිරීම නැවත මතක් කර ගැනීම ද වරදක් නොවේ.

සිංහයා ආහාර සොයා දී ඇති දැඩි කළ ඔහු ගේ ම පුතා වූ සිංහබාහු ඔහු ව මරා දැමීම එක්තරා පිටුපෑමක් නො වේ ? සුප්පා දේවිය තම බිරිඳ කර ගත් දා පටන් ආරක්ෂා කළේ සිංහයා ය. ප්‍රථමයෙන් අරක්ෂාව පතා ඈ සිංහයා කරා ආව ද තම තරුණ පුත්‍රයා ඉදිරියේ ඈ සිංහයා ගේ දැඩි ආරක්ෂාව ප්‍රතික්ෂේප කරන්නී ය.

එය සුප්පා දේවිය කළ පිටුපෑමක් ද? යන්න ඔබ ද සිතා බැලිය යුත්තකි. තම පියා වූ සිංහයා නො වටිනා පුද්ගලයෙකු වන්නේ රටේ සියලු දෙනා ගේ ම ආරක්ෂාව ගැන සිතූ සිංහබාහුට ය. වර්තමාන දරුවකුට මෙන් සිංහබාහුට තම පියා ගේ අගය නො වැටහුණේ ද? සිංහබාහුට එදා එය නො කළා නම් අද අප මෙතැන නො වන බව ද සිහියේ තබා ගත යුතු ය.

මෙවන් වර්තමානයක දීපිකා ප්‍රියදර්ශනී ගයන,

පිතු සෙනේ පිදූ පියකු නොමැති ලොව
දූ දරුවන් හිනැහී ඇතිදෝ
උන් ගේ සිත රැඳි තනිය මකන්නට
මව්නට කවදා හැකි වේදෝ....

යන ගීය තම පියා අමු අමුවේ ඝාතනය කළ පුතකුට සහ එවැනි උරුමයකින් පැවැත එන්නන්ට ද නො ගැළපේ.

එසේ නම් අද අප කොතැන ද යන්න නිරන්තරයෙන් සිතිය යුතු කාරණයක් බව සිහියේ රඳවා ගනිමු. එමෙන්ම ඝාතනයෙහි යෙදෙන අපේ කාලයේ දරුවන්ට කුමක් සිදු වේද යන්න සිතා බැලිය යුතු ය. ■

**ආර්. එම්. එන්. යූ. රත්නායක**